## රත්නාවලී බාලිකා විද්‍යාලය - ගම්පහ

### උසස් පෙළ (2026/2028) සඳහා අයදුම්පත් කැඳවීම

### බාහිර අයදුම්කරුවන් සඳහා උපදෙස්

1. අයදුම්පත **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** යොමු කළ යුතු ය.
2. අයදුම්පත අප පාසලට අනන්‍යව සකසා ඇති **ඇමුණුම 1 ආකෘතියට** අනුව ම විය යුතු අතර **ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් අයදුම්පත පිරවිය යුතු ය.**
3. අයදුම්පත සමඟ සාමාන්‍ය තැපැල සඳහා අවශ්‍ය රු. 70ක මුද්දර සහ ලියුම් කවරයක් එවිය යුතු ය.
4. ඉංග්‍රීසි මාධ්‍ය පන්ති ක්‍රියාත්මක වනුයේ ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා සහ වාණිජ යන විෂයධාරා සඳහා පමණක් බැවින් එම විෂයධාරා සඳහා අයදුම් කළ යුත්තේ (ඉංග්‍රීසි/සිංහල) **එක් භාෂා මාධ්‍යයකින් පමණි**.
5. විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ලබා ඇති සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතු ය. (අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කළ හෝ අනුමත විෂය සමගාමී කටයුතු සඳහා පමණක් අදාළ සහතිකපත් යොමු කළ යුතු ය. ජාත්‍යන්තර හෝ ජාතික/සමස්ත ලංකා හෝ පළාත් හෝ ලබාගත් පළමු, දෙවන හා තෙවන ස්ථාන සඳහා පමණක් ලකුණු ලැබෙනු ඇත.)
6. අයදුම්පත් අතරින් විභාග ප්‍රතිඵල අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.
7. අයදුම්පත් යොමු කිරීමේ අවසාන දිනය: **2026.06.30**
8. පහත දක්වා ඇති විෂය ධාරාවක් යටතේ විෂයයන් තුන තෝරා ගත යුතු ය. අතර **එක් තීරයකින් එක් විෂයය බැගින්** තෝරා ගත යුතු ය.

**I.** **ජෛවීය විද්‍යා විෂය ධාරාව:** ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව පමණි.

**II.** **භෞතීය විද්‍යාව විෂය ධාරාව:**

| විෂයය 1 | විෂයය 2 | විෂයය 3 |
|---|---|---|
| සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |

**III.** **වාණිජ විෂය ධාරාව:**

| විෂයය 1 | විෂයය 2 | විෂයය 3 |
|---|---|---|
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| | | ව්‍යාපාර සංඛ්‍යානය |

**IV.** **ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව:**

| විෂයය 1 | විෂයය 2 | විෂයය 3 |
|---|---|---|
| ජෛව පද්ධති තාක්ෂණවේදය | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | කෘෂි විද්‍යාව |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |

**V.** **ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව:** ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පමණි.

**VI.** **කලා විෂය ධාරාව:**කලා විෂය ධාරාවට අදාළ තෝරාගත යුතු විෂයයන් ඇමුණුම 2 මගින් ඉදිරිපත් කර ඇත.